‘දහම් නවෝදය’
අධර්මයේ මහා අරගලයට එරෙහිව
‘කිසිවෙකුට වැසිය නොහැකි
විවෘත දොරක්.’

‘දහම් නවෝදය’

**මෙම ප්‍රකාශන අධ්‍යයනයේ දී**
**අපගේ 4වන ප්‍රකාශනය,**
**‘ශුද්ධාත්ම පිය සටහන්’**
**අංක <u>12</u> සිට ප්‍රකාශනය අග දැක්වා**
**අධ්‍යයනය කරමින්**
**ජේසු සමිඳුන්ගේ අනාවරණයන් හා**
**එතුමන්ගේ ක්‍රියාවන් අධ්‍යයනය**
**සඳහා**
**<u>පළමු</u> තැන දෙන්න, ප්‍රමුඛතාවය**
**දෙන්න.**

# නිතර ම යාච්ඤාවෙන් අවදිව සිටින්න

## මෙය ලොව පුරා ප්‍රකාශ කිරීමට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙන ආදරයේ පණිවුඩයකි.

"ලොව පුරා මාගේ නාමයට ඉතා ආදරයෙන් ක්‍රියා කරමින් සභාවේ ඉදිරි ගමන් මඟ දෙවි පියාට අවනත වීමට ඇති අවංක ආශාවෙන් ක්‍රියාත්මක වන්නා වූ සෑම සංඝයකට ම නුඹලාගේ මෙම ප්‍රකාශන යොමු කරපන්න. ඔවුහු එය වඩවඩාත් ලෝකයේ ගැළවීම සඳහා බෙදා හරින්නට මඟ බලා සිටින්නෝ වෙති. මන්ද, මාගේ වචනය මාගේ පණිවුඩය ඔවුහු සොයමින් ලත වන්නෝය. **මෙය මාගේ ශුද්ධාත්මානුභාවය තුළ ලියැවෙන්නා වූ ද ප්‍රකාශ වන්නා වූ ද දෙයක් බැවින් මේ කිසිවක් කිසි විටෙක අකුරකින් හෝ වචනයකින් හෝ වෙනස් කරන්නට ඉඩ නොතබන්න.** මාගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ එය ඉතා ලහිලහියේ සූදානම් කර බෙදා හැරපන්න." (1999.07.01)

**(එනිසා ඔබට අවසර ඇත, ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් උපදෙස් පිළිපදිමින් මෙය ලොව පුරා ඕනෑ ම භාෂාවකින් මුද්‍රණය කර බෙදා හරින්නට.)**

(මෙම ප්‍රකාශනය ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන් උදෙසා ය. මෙය ලිය වී ඇත්තේ කිතු දහමට හුරු බසකිනි. සියලු බලැති දෙවියන් වහන්සේ හෙවත් මැවුම්කරුවාණෝ හෙවත් ධර්මයාණෝ ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියහ. මුළු මිනිස් සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදීමෙන් විමුක්තිය උදා කරමින් මරණය ජය ගෙන ප්‍රතාපවත් වූ ජේසු සමිඳාණෝ ජීවමාන ව සදාතනික ව වැඩවසති.

දෙවියන් වහන්සේ, මැවුම්කරුවාණෝ, ධර්මයාණෝ, ධම්ම යන ඕනෑ ම ඇමතුමකින් ඔබ ඕනෑ ම කෙනකුට මෙම ප්‍රකාශනය හා එක් විය හැකිය. අවදිව යාච්ඤාවෙන් සිටීම යනු ධර්මයාණන් හා සමීප ඇසුරකට සංවාදයකට පිවිසෙමින් සෑම සිදුවීමකට ම සංවේදී වීමයි.)

"ජේදුරු තුමාගේ මහා දේශනයේ ජොවෙල් දිවැසිවරයාගේ දිවැස් වැකිය ඉටු වන මොහොත දැන් පැමිණ ඇතැ"යි ජේසු සමිඳාණෝ ප්‍රකාශ කරති. "**දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක. අන්තිම දවස්වල දී සකල මනුෂ්‍යයන් හට මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි. එවිට ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති. ඔබේ තරුණයෝ දර්ශන දකිති. ඔබේ මහල්ලෝ ද පැතුම් පතති. එපමණක් නො ව ඒ දවස්වල දී මාගේ දැසි දසුන්ට වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නෙමි. ඔවුහු ද දිවැස් වැකි පවසති. තවද, ඉහළ අහසේ අරුම පුදුම දේ ද පහත පොළොවේ ලකුණු ද දක්වා ලමි. ලේ ද ගිනි ද දුම් වලා පටල ද ඇති වේ.**" (**ශුද්ධ බයිබලය - ක්‍රියා 2:17-19**)

ශුද්ධාත්මානුභාවය විසින් තෝරා ගෙන සකසා ගෙන පත් කරගෙන ඇති මෙම සංඝය, "මාගේ උත්තරීතර සංඝය" යනුවෙන් අමතමින් එහි දාස දාසින් තුළින් ජේසු සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

**1999.06.20 වන දින**

"පූජක, පැවිදි, ගිහි සියල්ලන් ඉතා අනතුරුදායක කාලයකට මුහුණ පා ඇති බව ප්‍රකාශ කිරීමට මම නුඹලා කැඳවූයෙමි. මාගේ සුදු එඬේරා ලෙස මා ප්‍රකාශ කළා වූ ඔහු (2 ජුවාම් පාවුලු පාප් තුමා) අද අසාධ්‍ය රෝගාතුර තත්ත්වයේ පසු වන්නේය. නුදුරේ දී ම ලෝකයේ ශ්‍රේෂ්ඨ නායකයින් රැසක් ඝාතනය වන්නේය. තෙවන ලෝක යුද්ධයේ මුල් අත්තිවාරම් දැන් දමමින්, නිම වෙමින් පවතින්නේය.

පුරාතන සර්පයා හෙවත් අද ඔබ සාතන්ගේ ලකුණ ලෙස හඳුන්වන්නා වූ ඒ සියල්ල ලෝකය පුරා නිරන්තරයෙන් දැන් මනුෂ්‍යත්වය විනාශ කරන්නට, මාගේ පියාණන් නුඹට දුන් නිදහස නැති කරන්නට කාලය යොදවා ඇත්තේය. එබැවින් ඔබ ඉතා ලහිලහියේ ම මෘගයාගේ ඒ සළකුණ වත්, යක්ෂයාගේ කිසිම රැවටීමකට වත් නොරැවටෙන පිණිස නිරන්තරයෙන් යාච්ඤාවෙහි ද නිරන්තරයෙන් මාගේ නාමයෙහි ද ශක්ති සම්පන්න වන ලෙස පත්‍රිකාවක් මුද්‍රණය කර ලෝකය පුරා සියළු භාෂාවලින් බෙදා හරින්න.

මා මේ ලෙස ඔබට කතා කරන ලද්දේ මගේ නාමයේ බලය ගැනත් යක්ෂයාගේ සියළුම ක්‍රියාවන් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ වත් කිසිත් නොදන්නා වූ මාගේ බැටළුවන්ට නුඹලා එඬේරුන් වන පිණිස ය. එබැවින් මෙම පත්‍රිකාව නිරන්තරයෙන් මුද්‍රණය කර ලොව පුරා බෙදා හරින්න. යක්ෂයාගේ සියළු රැවටීම් යක්ෂයාගේ සියලු මවාපෑම් පරාජිත බව එහි සඳහන් විය යුතුය.''

**1999.07.01 වන දින**

''මාගේ අසරණ බැටළුවන්ට මෙය ද පවසන්න. මා දමා ඇති ඒ අත්තිවාරම උඩ මා පිහිටෙව්වා වූ මාගේ ම සභාව තුළ හෙවත් මාගේ ප්‍රමුඛ සභාව වන කතෝලික සභාව තුළ පමණක් රැඳී සිටින්න. මාගේ නාමයෙන් ඇත් වන මාගේ ආනුභාවයෙන් ඇත් වී ඇති නොයෙක් ආකාරයේ ව්‍යාජ සභාවන් තුළ ගැළවීම සොයන්නට නොයන්න. ඒ බවත් විශේෂිත ව ඇතුලත් කරපන්න.''

# 666 දරණ මෘගයාගේ සියලු උපක්‍රමවලින් ප්‍රවේශම් වන්න, කාලය මෙය යි.

21වන සිය වසේ ආරම්භයට ලෝකය සූදානම් වන බව සියලු ජනමාධ්‍යයෝ අද ඔබට දන්වමින් සිටිති. මුදල් ගනුදෙනු, කර්මාන්ත, ප්‍රවාහනය ඇතුළු ලෝක ආර්ථික කටයුතු ද දේශපාලනය, ජනමාධ්‍ය පමණක් නො ව ආගම් ද නව සියවස සඳහා නවීන විද්‍යාවට සහ පරිගණක තාක්ෂණයට යටපත් කිරීමට යම් යම් කණ්ඩායම් උත්සාහ දරමින් සිටිති. එහෙත් මේ කාලය සඳහා ඔබ සූදානම් විය යුත්තේ ඒ අයුරින් නො වේ. මන්ද, ඔබගේ පරික්ෂණ කාලයට දැන් ඔබ පැමිණ ඇති බැවිනි.

**ශුද්ධ බයිබලයේ එළිදරව් පොතේ 13:5** සහ **12:14** සටහන් ව ඇති මෙම මාස 42ක කාලය සියලු ලෝ වැසියන් කෙරෙහි ඉක්මනින් උදා වනු ඇත. මෙම පරික්ෂණයේ එක් කොටසක් මනුෂ්‍යයාට ලැබෙන පීඩාවලින් ද, අනෙක් කොටස පරික්ෂාවෙන් ද යුක්තය. පීඩාව බොහෝ විට මනුෂ්‍යයා තුළින් සහ ලෝකයෙන් ලැබෙන අතර, පරික්ෂාව සාතන් සපයන කෙටිකාලීන ලෞකික සුඛ විහරණය මගින් හා විද්‍යාව සහ තාක්ෂණය මගින් සපයන මෝහනයන්ට ගොදුරු වීමේ ප්‍රවනතාවයෙන් ලැබේ.

යුගාන්ත විනිශ්චයට ආසන්න මෙම වකවානුවේ දී මෙවැනි පරික්ෂණ කාලයක් (Chastisement) මනුෂ්‍යයාට අවශ්‍ය වන්නේ මන්ද?

01. මනුෂ්‍යයකු තම ජීවිත කාලය පුරා තමා ගොඩනගා ගත්තා යයි සිතන ආධ්‍යාත්මික ජීවිතයේ සාර්ථකත්වය නොහොත් තම ආශාවල සහ කල්පනාවල යථා ස්වභාවය කෙබඳු දැයි මැන ගැනීමට මෙයින් අවස්ථාව ලැබේ.

02. ජීවිත කාලය පුරා කෙනකු ඇදහූ ආගම සහ කරන ලද යහපත් ක්‍රියාවල අවංක අරමුණ සහ තම අනාගත සදාකාලීන පැවැත්මට අදාල තමන් තුළ ඇති සැබෑ අපේක්ෂාව මෙම පරික්ෂණයේ දී තමා ක්‍රියා කරන ආකාරයෙන් පිළිබිඹු වනු ඇත.

03. වසර දහස් ගණනක කාලයක් සියලු ආගම්වල විවිධ තරාතිරම්වල නායකයන්, ප්‍රධානින්, සියලු නිකායවල ගිහි පැවදි මූලිකයන්, ආගමික ගුරුවරුන් තමන් මෙතෙක් වැපුරුවා යැයි සිතන, වැපුරුවා යැයි කියන ආධ්‍යාත්මික බීජවල අස්වැන්න කෙබඳු දැයි ඔවුන්ට ම තේරුම් ගැනීමට අවස්ථාවක් ලබා දීම.

04. දෙවියන් වහන්සේ ගැන කතා කරන බොහෝ ආගම්, ආගමික සංවිධානයන්, සභාවන්, නිකායන් ඔවුන් දෙවියන් වෙනුවෙන් කර ඇත්තේ යැයි සිතන සේවය නිවැරදි ද නැතහොත් නිෂ්ඵල වී ද යන්න ඔවුන්ට ම තේරුම් ගැනිමට අවස්ථාවක් ලබා දීම.

05. සෑම ප්‍රධාන ආගම්වල ම බොහෝ ලබ්ධිකයන්, මූලිකයන් සිතන්නේ සහ නිතර පවසන්නේ තමතමන්ගේ ආගම් වඩා නිවැරදි ස්ථාවරයක් දරණ බවයි. තම සභාව, තම නිකාය, තම ධර්මය, ග්‍රන්ථ හා ඉගැන්වීම තම විශ්වාසය, තම වත් පිළිවෙත්, තම ක්‍රියාමාර්ගය හා දර්ශනය වඩා උතුම් බවයි. එසේ නම් ඒ බව ප්‍රායෝගික ප්‍රතිඵලවලින් ඔප්පු කර පෙන්වීමේ අභියෝගය මේ පරීක්ෂණයෙන් ඔවුන් සැම දෙනා වෙත ම පැවරෙයි. ඒ අනුව තමතමන්ගේ ආගම අදහන ජනතාවගෙන් වැඩි දෙනකු තෝරාගන්නේ සාතන්ගේ කෙටිකාලින ලෞකික ප්‍රතිලාභයන්ට රැවටීම ද, නැතහොත් වටිනා ආධ්‍යාත්මික ගමන ද යන්න මෙම පරීක්ෂණයෙන් අවබෝධ කරගත හැකිය.

06. විමුක්තිය සෙවීම යනු ලෞකිකත්වය වැළඳ ගැනීමක් නො වන නමුත් වසර දහස් ගණනක් පුරා ඔබගේ ආත්මික මෙන් ම ලෞකික අවශ්‍යතා සඳහා ද ඔබ දෙවිඳුන්ගෙන් කරන ලද ඉල්ලීම්වලට උන්වහන්සේ පිළිතුරු සැපයූ බව ඔබ දන්නා කරුණකි. එහෙත් මේ ඉතා කෙටි පරීක්ෂණ කාලය තුළ දෙවිඳුන් සැමට ම පවසන්නේ ලෞකික දේ වෙනුවට හැකිතාක් ආධ්‍යාත්මික දේ ම ඉල්ලන ලෙසයි. මන්ද, මෙය යුගාන්ත විනිශ්චයේ දොරකඩ (එළිපත්ත) බැවින් ආධ්‍යාත්මික දේ ඉල්ලීමට මූලිකත්වය දෙන ලෙසයි. එමෙන් ම මේ කෙටි කාලය තුළ දී ලෞකික දේ අවශ්‍ය පමණටත් වඩා දීමට සාතන් හා ඔහුගේ සහචරයන් ඉදිරිපත් වන බැවින් ප්‍රවේශම් වන ලෙස යි.

07. ඉහත සියලු කරුණුවල බලපෑමෙන් විනිශ්චයට සහ නව යුගයට අවශ්‍ය පවිත්‍රකරණයට (Purification) මනුෂ්‍යයා මුහුණ දිය යුතුය. එවිට ඔබ වඩා කැමති ධර්මයට ද, අධර්මයට ද යන්නත් ඔබ වැළඳ ගන්නේ දේව ප්‍රේමයේ ආධ්‍යාත්මික මාර්ගය ද, නැතහොත් ලෞකිකත්වය ද යන්නත්, ඔබට ම තීරණය කරගත හැකිය.

මේ කාලයේ භූ චලන, ජල ගැලීම්, සාගත, යුද්ධ, විෂ වායු ආදි විපත් සිදු වීම බොහෝ සෙයින් වැඩි වනු ඇත. තවද, මේ පරීක්ෂණ කාලයේ සිදු වන එක් විශේෂ සිදු වීමක් නම් දෙවියන් වහන්සේගේ මහා අනතුරු ඇඟවීම යි. (Great Warning) දේව කරුණාවෙන් මනුෂ්‍යයාට තම දිවිය පුරා සිදු වූ පාප සිහිපත් කරවන මෙම අනතුරු ඇඟවීම භූ චලන, ඝන අඳුරින් වැසී යාම, උල්කාපාත බලපෑමක් නිසා සිදු වන කම්පනයක් හා පීඩනයක් මගින් විය හැකිය. මෙමගින් දෙවිඳුන් මනුෂ්‍යයාට අවධාරණය කරන කාරණා සමහරක් නම් මිනිසා දෙවිඳුන්ට විරුද්ධව ක්‍රියා කරමින් සිටින බවත්, මිනිස් ජීවිත ක්‍රමය වෙනස් කර ගත යුතු බවත් පව්වලට දේව දඬුවම් හිමි ව ඇති බවත් ය. එමෙන් ම මැවුම්කරුවාණන් හෙවත් ධර්මයාණන් පිතා, පුත්‍රයා, ශුද්ධාත්මයාණන් නමැති ත්‍රිත්වික සංඝය බවත්, පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම දිව්‍යමය ශරීරය සහිතව දිව්‍ය සත්ප්‍රසාදයෙහි ජීවමානව වැඩවසන බවත් මේ අනතුරු ඇඟවීම මනුෂ්‍යයාට වැඩිදුරටත් අවධාරණය කරයි.

මේ කාලය ඔබට හඳුන්වා දෙන නවීන විද්‍යාව ඔස්සේ යක්ෂයා, සාතන්, අන්ත ක්‍රිස්තු හෙවත් පුරාතන සර්පයා ඉතා සූක්ෂ්ම ලෙස පරිගණකය, අන්තර්ජාලය, බාර්කෝඩ් සහ මයික්‍රෝචිප් එක උපයෝගි කොට ගෙන ඔබට නැවත තහනම් ගෙඩිය දීමටත්, එමගින් ඔබව ඔහුගේ ග්‍රහණයට ගෙන දෙවිඳුන් ඔබට දුන් ඔබගේ උත්තරීතර නිදහස ඔහුගේ අණසකට යටත් කිරීමටත් සැලසුම් ක්‍රියාත්මක කරගෙන යයි.

මේ තහනම් ගෙඩිය නොකන ලෙස එනම් ඊට නොරැවටෙන ලෙස අප සැමගේ සමිඳුන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මීට වසර දෙදහසකට පමණ පෙර සිට ම අවවාද කර ඇත. ක්‍රි.ව පළමු වන සිය වසේ අග භාගයේ දි මේ කරුණු සුවිශේෂක ශුද්ධවර ජුවාම් තුමා නිවැරදිව **ශුද්ධ බයිබලයේ එළිදරව් පොතේ 13 පරිච්ඡේදයේ 16-18** පදවල මෙසේ සඳහන් කර ඇත.

**"තවද ඌ ලොකු කුඩා, දුප්පත් පොහොසත්, දාස නිර්දාස යන සියල්ලන්ට තමන්ගේ දකුණතේ හෝ නළලේ හෝ සලකුණක් ලබන්නට සැලැස්විය. ඒ සලකුණ වන මෘගයාගේ නාමය හෝ උගේ නාමය අභවන අංකය හෝ ඇත්තාට මිස, අන් කිසිවෙකුට මිලයට ගන්නට වත් විකුණන්නට වත් ඉඩක් නොතැබිය. නැණ නුවණ අවශ්‍ය වන්නේ මෙතැන දි ය.**

**නුවණැත්තා, මෘගයාගේ අංකය ගණන් බලා දැන ගනිවා. මන්ද, එය මනුෂ්‍යයකුගේ නාමය දක්වයි. ඒ ගණන හයසිය හැට හයයි.**"

ශුද්ධ බයිබලයේ ගත වර්ෂ 20ක් තිස්සේ අනතුරු අඟවා ඇති මෙම කාරණය යුගාන්තයේ සිදු වන බව **ශුද්ධවර ජුවාම් තුමා** දර්ශනය කර ඇත. **එළිදරව් 13** පරිච්ඡේදයේ ඇති එම කාරණයට අදාල ව පහත සඳහන් විස්තර ද ඔබ තේරුම් ගත යුතුය.

මකරා ලෙස මෙහි සඳහන් කර ඇත්තේ, දෙවිඳුන් ප්‍රතික්ෂේප කරන, ජනතා නිදහස ප්‍රතික්ෂේප කරන ඒකාධිපති හා අන්තවාදි දේශපාලන ව්‍යාපාරයන් ය. කලු මෘගයා නමින් හඳුන්වා ඇත්තේ, සූක්ෂ්මව සහ රහසිගතව ලොව පුරා ව්‍යාප්තව ඇති, තම නියෝජිතයන්ට රට රටවල රාජ්‍ය බලය සහ ව්‍යාපාර බලය අල්ලා ගැනීමට සහ ව්‍යාප්ත කිරීමට කූට උපක්‍රමවලින් උදව් කරන සාතන්ට කලු පූජා (Black Mass) පවත්වන ගුප්ත මේෂනික් (Masonic) ව්‍යාපාරය යි. (අද සමහර ලෝක ප්‍රසිද්ධ පුද්ගලයෝ පවා මෙහි සාමාජිකත්වය දරති.)

**එළිදරව් 13**හි බැටළුවකුගේ මෙන් අං දෙකක් ඇති මෘගයා ලෙස හඳුන්වා දි ඇත්තේ, කතෝලික සභාවට ඇතුළු වී එහි ඉහළ ම පූජක තනතුරු අල්ලා ගනිමින් ද ලොව පුරා කතෝලික පැවදි පූජක සහ ගිහි ප්‍රධානින් වේශයෙන් සිටිමින් ද සූක්ෂ්ම ලෙසත් රහසේත් ක්‍රියාත්මක වන කලු පූජා පවත්වන මේෂනික් ව්‍යාපාරය යි. (Freemasonry) මොවුන් විසින් සභාවේ සත්‍ය විශ්වාසය සහ ධර්මය ද, ඉගැන්වීම් ද, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍යමය සම්බන්ධය ද ව්‍යාකුල කරමින් ව්‍යාජ සභාවක්, ව්‍යාජ පාප්වරයකු සහ ව්‍යාජ ක්‍රිස්තුවරයකු (මෛත්‍රී නමින් ව්‍යාජ ගැලවුම්කරුවකු) ඉදිරිපත් කරනු ඇත. තවද, සභාවට වැදුණු මෙම රහසිගත සංවිධානය (බැටළුවකුගේ මෙන් අං ඇති මෘගයා) මගින් පාපය සාධාරණීකරනය කරමින්, පාපය ද වටිනාකමක් ඇති දෙයක් ලෙස හඳුන්වා දෙමින්, ස්වාභාවික ආශාවන් තමන් රිසි ලෙස සතපවා ගැනීමට ඉඩ හරිමින්, පාපය පිළිබඳව මිනිසා ව මනස්ස්ථාපනයට කැඳවන මූලයන් විනාශ කර දමයි.

මෙම බැටළු අං ඇති මෘගයා බයිබලයේ ඇති දේව වචනයට තර්කානුකූල ස්වභාවයක් දෙමින් එහි ඇති ඓශ්වර්යවත් අන්තර්ගතය හිස්කර එහි ඇති දිව්‍යමය පණිවුඩය විකෘති කර දැමීමට වෙහෙසෙයි. මෙලෙස වූ වැරදි අර්ථකථනයන් සියලු ක්‍රිස්තියානි සභාවල ද, කතෝලික සභාව තුළ ද මුළු ලොව පුරා ම හැකිතාක් ව්‍යාප්ත කිරීම ඔහුගේ සැලැස්මයි. ඒ සමග ම දෙවි පියාණන්ගේ කරුණාවේ වරප්‍රසාද ලොවේ සියළුම මනුෂ්‍යයන් වෙත ගලා එන දිව්‍ය පූජාවේ යාගික කොටස නියම ආකාරයෙන් සිදු නොකෙරෙන ලෙසට ක්‍රියා කරයි. දිව්‍ය සත්ප්‍රසාදය තුළ දේවත්වයට හිමි මහිමාන්විත ශරීරයෙන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වැඩ සිටීම නොසලකා එයට ගරු බුහුමන් දැක්වීම දුර්වල කරමින් ද දිව්‍ය සත්ප්‍රසාදය අවතක්සේරු කරමින් ද එය හුදු ආහාර බෙදා ගැනීමේ සහෝදර ක්‍රියාවක් ලෙස අර්ථකථනය කිරීමට යත්න දරයි.

විවිධ මතිමතාන්තර මගින් දූෂ්‍යය වී ඇති මූලධර්මවාදි කිතුනු සභාවන් සමග කතෝලික සභාව ද එකට යා කර මූලික ලෝක කිතුනු සභාවක් බිහි කිරීමට තැත් කරයි. ඒ සඳහා කතෝලික ධර්මයේ ඇති දිව්‍යමය ඉගැන්වීම් සහ වත්පිළිවෙත් ජේදනය කරයි. මෙලෙස සැබෑ කිතුනු වටිනාකම්, වත් පිළිවෙත් සහ මඟ පෙන්වීම් ව්‍යාකූල කර අකාමකා දැමීමට උත්සාහ කරයි. එසේම මෘගයාගේ නියෝජිතයෝ දැනටමත් ලෝක සංවිධානයන්ට සහ ආර්ථික කේන්ද්‍රස්ථානයන්ට ඇතුලු වී තම ආධිපත්‍ය පතුරුවා හරිමින් සිටිති. මොවුහු තවත් ඉදිරියට යමින් ආගම්වල ආධ්‍යාත්මික හරයන් අඳුරු කිරීමටත් භෞතික දියුණුව සඳහා ලොව සියලු ආගම් සමග සංධානයක් ඇති කර ගැනීමටත් උත්සාහ කරති. එලෙස ලොව පුරා ම තම ආධිපත්‍ය පැතිරවීම ඔවුන්ගේ අරමුණයි.


ඒ මගින් කළු මෘගයා සහ බැටළුවකු මෙන් අං ඇති මෘගයා නියෝජනය කිරීම සඳහා (නමුත් ඔවුන්ව නියෝජනය කරන බව සඟවා) මෘගයා (Beast) නමින් ඉතා දියුණු බලවත් උපකරණයක් (කම්පියුටරයක්) පිළියෙල කරයි. මෘගයාගේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති අනුමත කර ක්‍රියාත්මක කිරීමට හා ඒවායින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහාත් එහි සාමාජිකයකු වීම සඳහාත් පරිගණකය හා බැඳුණු ඉතා කුඩා උපකරණයක් එනම් මයික්‍රෝ චිප් එකක් (Micro Chip) මනුෂ්‍යයාගේ නළලේ හෝ අතේ තැන්පත් කරයි. එමගින් තම බුද්ධිය ද තම ශාරීරික ක්‍රියාකාරීත්වය ද මෘගයාට යටත් කළ බව හැඟවෙයි.

ලොව සියලු මනුෂ්‍යයාට හා සත්වයින්ට අනාදිමත් කාලයක සිට ආහාර සපයන මහා ප්‍රේමයාණන් වූ දෙවි සමිඳුන්ගෙන් යැපීම වෙනුවට, උන්වහන්සේගේ සත්‍ය වූ ධර්මයෙන් යැපීම වෙනුවට මෘගයාගෙන් යැපීමට ඒ අනුව දිවුරුම් දෙයි. මේ වන විටත් ලොව සෑම රටක ම ස්වල්ප දෙනකු හෝ මේ උපක්‍රමයට ගොදුරු වී ඇති බව, සමිඳුන් ම අනාවරණය කර ඇත. මෙලෙස මනුෂ්‍ය ප්‍රේමය, සත්‍යය හා ශුද්ධත්වය කෙලෙසමින් මිනිසාට දෙවිඳුන් ලබා දුන් ඒ උතුම් නිදහස, මයික්‍රෝ චිප් එක මගින් සාතන්ගේ අතට ගැනීමටත් ඊට ප්‍රතිලාභයක් ලෙස කෙටි කාලයකට හෝ මෙලොව සැප සම්පත්, ආහාර පාන, සුඛ විහරන ඇති කාමසුඛල්ලිකානු දිවියක් සමග මෙලොව නවීන තාක්ෂණ දියුණුවට අනුයුක්ත වීමටත් අවස්ථාවක් ලබා ගැනීමට ආධාර කරයි.

ඉහත දැක්වූ **එළිදරව් 13: 16-18 බයිබල් පාඨයෙන්** ඔබට පෙන්වා දෙන කාරණය බැලූ බැල්මට ඔබට නොපෙනුනත් ක්ෂණිකව අවබෝධ නො වුනත් එය ඔබගේ අත ළඟට ම පැමිණ ඇති බවටත් එයින් ඔබ සහ ඔබගේ පවුලේ අය සහ හිතවතුන් ආරක්ෂා විය යුතු බවටත් මෙයින් අවධාරණය කරමු. මන්ද, මනුෂ්‍යයාට තහනම් ගෙඩිය දී ඔහු රවටා නොමඟ යවා අන්ධකාරයේ හෙළීමට ක්‍රියා කළ ආදි සර්පයා නැවත පැමිණෙන බව **එළිදරව්** පොතේ **12: 7-9**හි සඳහන් කර ඇති බැවිනි. තවද, එම ආදි සර්පයා ඔබ අසලට ම පැමිණ ඔබේ දෙපා ළඟ දැවටෙමින් සිටින බව ඔබට ම තේරුම් ගැනීමට ලැබෙන්නේ නම් එය ද මහත් ආශිර්වාදයකි.

ඉහත දැක්වූ බයිබල් පාඨයෙහි (**එළිදරව් 13: 16-18**) අදට වසර එක් දහස් නව සියයකටත් පමණ පෙර ශුද්ධාත්මානුභාවයෙන් එළිදරව් ලබාගෙන දකුණතෙහි හෝ නළලෙහි හෝ තබන සළකුණ (මුද්‍රාව) ලෙස හැඳින්වූයේ දැන් භාවිතය අරඹා ඇති මයික්‍රෝ චිප් එක බව පැහැදිලිය. මයික්‍රෝ චිප් එකේ කෙනකුගේ උප්පැන්න සහතිකය, හැඳුනුම්පත, බැංකු ගිණුම, ක්‍රෙඩිට් කාඩ්පත, වෛද්‍යාධාර කාඩ්පත, රියදුරු බලපත්‍රය, පාස්පෝට් එක සහ භාණ්ඩ මිලට ගැනීමේ දී (මුදල් වෙනුවට භාවිතා කරන) කෑෂ් කාඩ් පත ආදි සෑම දෙයක් ම අඩංගු කළ හැකිය. ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල, දැන් භාවිතා කෙරෙන කෑෂ් කාඩ් පතේ ද ඇත්තේ මයික්‍රෝ චිප් එකකි. එහි කාඩ් පත ඉවත් කර මයික්‍රෝ චිප් එක පමණක් වුව ද මනුෂ්‍යයාගේ අතේ හෝ නළලේ තැන්පත් කිරීම අපහසු දෙයක් නො වේ. එයටත් වඩා ඉතා සියුම් ලෙස පිළියෙල කරන මෘගයාගේ මයික්‍රෝ චිප් එකෙහි බොහෝ විස්තර අඩංගු කළ හැකිය. එම මයික්‍රෝ චිප් එක කියවන රීඩරයන් භාණ්ඩ හා සේවා සපයන ස්ථානයන්ට භාර දී ඇත. එම රීඩරය කියවන සෑම විටම එය මෘගයා නමින් ඇති පරිගණකයේ සටහන් වෙයි. එම චිප් එක ශරීරයේ තැන්පත් කිරීමේ කූට උපක්‍රමයට හසු වීමට ඔබ සහ ඔබගේ හිතවතුන්ටත් ඔබට හැකි නම් සෑම දෙනාටත් ඉඩ නොතැබීම ඔබගේ යුග මෙහෙවර යි.

තවද මේ මයික්‍රෝ චිප් එක භාවිතයෙන් නවීන ලෝකය සමග ඉදිරියට යා හැකි බවත් භාණ්ඩ හා සේවා රැකියා සැපයීම කාර්යක්ෂම වන බවත් මුදල් සංසරණයෙන් තොරව පහසුවෙන් ගනුදෙනු සිදු කළ හැකි බවත් රටේ වංචා, සොරකම් සහ නීති විරෝධි ක්‍රියා මැඩලිය හැකි බවත් ඒ නිසා මෙය ලබාගත යුතු බවත් මනුෂ්‍යයා අතර ප්‍රචාරය කෙරේ. තවද, මනුෂ්‍යයාව ආර්ථික දියුණුවේ සහ සුඛෝපභෝගීත්වයේ ඉහළට ම ගෙන යා හැකි බව කියමින් මෘගයාට පක්ෂ රාජ්‍ය නායකයින් මෙම මයික්‍රෝ චිප් එක අනිවාර්යෙන් ම ශරීරයේ තැන්පත් කරගත යුතු යැයි මහජනතාවට බලකිරීමට ඉඩ ඇතත් ඔබ කිසි විටෙකත් එය ලබා නොගත යුතුය. මේ නිසා කෙටි කාලීන ව ඔබට යම් යම් දුෂ්කරතා ඇතිවිය හැකිය. එහෙත්, ඔබ ඊට බිය විය යුතු නො වේ. ''**පළමුව දේව රාජ්‍යය ද, ධර්මිෂ්ඨකම ද සොයන්න. එවිට ඔබට සියල්ල දෙනු ලැබේ.**'' යැයි **ශුද්ධ බයිබලයේ මතෙව් 6:33**හි ජේසුස් වහන්සේගේ වචන ප්‍රකාර ඔබගේ සියලු අවශ්‍යතා දෙවිඳුන් විසින් ම සපයා දෙනු ලැබේ.



දෙවියන් වහන්සේගේ ත්‍රිත්වීකත්වය සහ ශුද්ධවූ ත්‍රිත්වයේ ඒකාබද්ධතාවය සංකේතවත් කරන ත්‍රිකෝණය සහ ඇස ක්‍රිස්තු විරෝධියා ද (Anti Christ) තම ලකුණ ලෙස යොදාගෙන ඇත. තවද මෙම කණ්ඩායම් පිරමීඩය ද තම ලකුණ ලෙස යොදා ගනිමින් සිටිති. ඉතා සූක්ෂ්ම ලෙස මේ සංකේත ඔවුන් පාවිච්චි කරන බැවින් ඔබ සැමදෙනා ද විමසිලිමත්ව සිට ඔවුන්ගේ උපායන් හඳුනා ගන්න.

ලොව පිලිගත් ජාත්‍යන්තර මුල්‍ය ආයතන එහි යම් යම් අවශ්‍යතා සඳහා සෑම ඉංග්‍රීසි අක්ෂරයකට ම යම් වටිනාකමක් ආරෝපනය කර ඇත. එය මෙසේ ය. A=6, B=12, C=18, D=24 ආදි වශයෙන් ඊළඟ සෑම අකුරකටම 6 බැගින් එකතු කර එය සකස් කර ඇත. මේ අනුව කම්පියුටර් (Computer) යන වචනයේ අකුරුවල එකතුව ඔබට ගණන් බලා දැන ගත හැකිය.

C=18, O=90, M=78, P=96, U=126, T=120, E=30, R=108, = 666

මෘගයාගේ අංකය රහසිගතව සඟවා ඇති තවත් ස්ථානයකි, කම්පියුටර් බාර් කෝඩ් එක. මේ බාර් කෝඩ් එකේ එක් එක් ඉර මත යම් සංකේත අංකයක් ඇත. භාණ්ඩයේ මිල ඇතුළු වෙනත් විස්තර පමණක් නො ව මෘගයාගේ අංකය ද එහි සටහන් ව ඇත. (**එළිදරව් 13:17**) අනුව මෘගයාගේ අංකය අඩංගු බාර් කෝඩ් එක නොමැති කිසිවක් මිලට ගැනීමට හෝ විකිණීමට නොහැකි වන්නේය. අද ලොව පුරා සුපිරි වෙළඳ සැල් සෑම එකක ම පරිගණක භාවිතා කරන බැවින් භාණ්ඩ මිලට ගැනීමට හා විකිණීමට එම බාර් කෝඩ් එක අඩංගු ස්ටිකරය ද අනිවාර්ය වී ඇත. මයික්‍රෝ චිප් එක මෙම තත්ත්වය තවත් ඉදිරියට ගෙන යමින් සිටියි.

ඔබගේ නිවසේ හෝ කාර්යාලයේ පරිගණකයක් තිබීම හෝ ඔබ එය පාවිච්චි කිරීම හෝ ප්‍රශ්නයක් නො වේ. බාර් කෝඩ් සහිත භාණ්ඩයක් මිල දී ගැනීම හෝ විකිණීම ද ප්‍රශ්නයක් නො වේ. A.T.N කාඩ් පතක් හෝ Cash කාඩ් පතක් භාවිතා කිරීම ද ප්‍රශ්නයක් නො වේ. නමුත් ඔබ එතැනින් එහාට නොයා යුතුය. එතැනින් එහා ඇත්තේ 'තහනම් ගහ යි' එනම් මයික්‍රෝ චිප් එක යි. එම නිසා ඔබ කිසි කලෙක එය ලබා නොගත යුතුය. එය ලබා ගන්නා අය බලහත්කාරයේ හා අන්ධකාරයේ ආධිපත්‍යයට යටත් වෙයි. දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ආලෝකය ඔබව නිදහස් කර ස්වර්ග රාජ්‍යය කරා මෙහෙයවන අතර යක්ෂයාගේ ආධිපත්‍යය මනුෂ්‍යයාව විනාශය කරා ගෙන යයි.

මෙලෙස මයික්‍රෝ චිප් එක ලබා ගෙන ඇති අයට අවශ්‍ය සියළු භාණ්ඩ හා සේවා එමගින් සැපයීමට හැකි වන අතර මනුෂ්‍යයාගේ මනස පවා මෘගයාට කැමති පැත්තකට යොමු කිරීමට ඔහුගේ කණ්ඩායමට හැකි වෙයි. මෙම මයික්‍රෝ චිප් සළකුණ ලබා ගැනීම (මෘගයාට නමස්කාර කිරීම) ප්‍රතික්ෂේප කරන අයව මරා දැමීමට පවා මෘගයා උත්සාහ කරයි. ඔබගේ සදාකාල ස්වර්ග රාජ්‍ය වෙනුවෙන්, මෙම කෙටි කාලය තුළ හෝ පරිත්‍යාගි වීමට හැකියාවක් සූදානමක් ඔබ තුළ තිබිය යුතුයි. යක්ෂයාට ක්‍රියා කිරීමට ඉඩ දී ඇති මෙම කෙටි කාලය අවසානයේ දී සිදු වන දෙය (**එළිදරව් 16:2**හි) සඳහන් කර ඇත්තේ මෙසේ ය.

"**එකල පළමුවැන්නා ගොස් තමාගේ පාත්‍රය පොළොව පිට වැගිරෙව්වේය. එවිට මෘගයාගේ සලකුණ දැරූ අයට ද, ඔහුගේ රූපයට නමස්කාර කළ අයට ද දරුණු දුස්සාධ්‍ය වණ හටගති**."

මයික්‍රෝ චිප් එක පැළඳ ගත් විට එය ප්‍රධාන පරිගණකය සමග සම්බන්ධය පවත්වන්නේ විද්‍යුත් චුම්බක තරංග ඔස්සේ බැවින් එම තරංගවල බලපෑමෙන් මනුෂ්‍යයාට පිළිකා වැනි තුවාල ඇති කිරීමට හේතු වන බව විද්‍යාඥයින් පවසා ඇත. වසර එක් දහස් නව සියයකටත් පෙර ශුද්ධවූ ජුවාම් තුමා ශුද්ධාත්මානුභාවයෙන් දර්ශනය කර ඇති දෙය කොපමණ සත්‍යයක් ද?

“සනසන්න,
මාගේ සෙනඟ සනසන්නැ” යි දෙවියන් වහන්සේ වදාරන සේක.
කරුණාවෙන් ජෙරුසලෙම් වැසියන්ට කතා කරන්න;
හඬ නඟා ඔවුන්ට මෙසේ කියන්න;
ඔවුන්ගේ වහල්කමේ කාලය දැන් ඉවර වී ඇත;
පව් කමාව ඔවුන්ට ලැබී ඇත;
සියලු පව්වලට දඬුවම දෙ ගුණය බැගින් සමිඳුන්ගේ
හස්තයෙන් ම ඔවුන්ට ලැබී ඇත.
මෙසේ මොරගසන හඬට සවන් දෙන්න.
“පාළුකරයෙහි සමිඳුන්ගේ මාවත සාදන්න;
අපේ දෙවිඳුන්ට වනයෙහි මාවතක් සමතලා කරන්න;
සියලු මිටියාවත් පුරවනු ලබන්නේය;
සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේය;
ඇද තැන් ඇද හරිනු ලබන්නේය;
රළු තැන් සුමුදු කරනු ලබන්නේය;
සමිඳුන්ගේ තේජාලංකාරය එවිට එළිදරව් වන්නේය;
සියලු මනුෂයෝ එක් ව එය දකින්නෝය;
මක්නිසාද, ස්වාමින් වහන්සේගේ මුඛය එය වදාළ සේක.
මොරගසන්නෙකුගේ හඬක් වෙයි.
මම කුමක් කියා මොරගසම් දැයි කෙනෙක් ඇසිය,
මාංශමය වූ සියල්ලෝ තණකොළ හා සමාන වෙති;
ඔවුන්ගේ සියලු අලංකාරය කෙතේ මලක් මෙන් ය;
සමිඳුන්ගේ හුස්ම වැදුණු විට තණකොළ වියළී යයි; මල පරවෙයි;
සියලු මිනිස් වර්ගයා, ඒ තණකොළ හා සමානය.
තණකොළ වියළෙයි, මල් පරවෙයි, එහෙත් අපේ දෙවියන් වහන්සේගේ
වචනය සාදාකාලයට ම පවත්නේය.
සියොන්ට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි, උස් කන්දට නගින්න;
සියොන්ට සුබ ආරංචිය දන්වන්න. ජෙරුසලෙමට සුබ ආරංචිය ගෙනෙන දූතයාණෙනි
හඬ නඟා ප්‍රකාශ කරන්න. බිය නොවී උස් හඬින්, ඔබේ දෙවිඳාණෝ වඩින සේකැ’ යි
ජුදාහි නගරවලට ප්‍රකාශ කරන්න.
සමිඳුන් වන දෙවිඳාණෝ බලපරාක්‍රමයෙන් වඩින සේක.
වික්‍රමයෙන් පාලනය කරන්ට වඩින සේක.
ත්‍යාගයන් එතුමාණෝ තමන් සමග ගෙන එන සේක.
තම සෙනඟට විපාකයන් ප්‍රදානය කරන සේක.
එඬේරකු සේ එතුමාණෝ තම රැළ පෝෂණය කරන සේක;
දෑතින් බැටළු පැටවුන් වඩාගෙන,
ළයෙහි උන් හොවාගෙන යන සේක;
කිරි දෙන බැටළු දෙනුන්ට මග පෙන්වන සේක.”

(ශුද්ධ බයිබලය - යෙසායා 40: 1-11)

---

ප්‍රකාශන - අංක 01
1999 ජුලි
මෙම ප්‍රකාශනය පිළිබඳ වගකීම : “දහම් නවෝදය”

---